ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී උපාධි පාඨමාලාව - 4 වන මට්ටම

අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය II 2021/2022

පරිපාලන නීතිය - LLU4707/LWU2313

කාලය - පැය එකයි. (01)

---

දිනය - 2022.09.16 වේලාව - පෙ.ව. 09.30 - පෙ.ව. 10.30

---

එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

01. තම කලත්‍රයා සහ දරුවන්ට සහයෝගය දැක්වීමේ යුතුකම (Duty of Support) පිළිබඳ බැඳීම පොදු නීතිය මෙන්ම ව්‍යවස්ථාපිත නීතිය ද හඳුනා ගනී. පවුලේ සුබසාධනය තහවුරු කිරීම සඳහා ව්‍යවස්ථාදායකය කලින් කලට නීති පැනවීම හරහා මැදිහත්වීම සිදු කරයි.

අධිකරණ තීන්දු සහ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන දක්වමින් සහයෝගය දැක්වීම පිළිබඳ කලත්‍රයන්ගේ සහ දෙමාපිය බැඳීම සම්බන්ධ ශ්‍රී ලංකා නීතියේ සංවර්ධනය සාකච්ඡා කරන්න. (ලකුණු 20 )

02. සුමනා සහ සරත් වසර 10 ට වැඩි කාලයක් විවාහ වී සිටියහ. එකී විවාහයෙන් ඔවුනට දරුවන් දෙදෙනෙකු සිටී. පසුව ඔවුන් දෙදෙනා අතර වෛවාහක සම්බන්ධතාවය දෙදරාගිය අතර සුමනා දිසා අධිකරණයේ නඩුවක් ගොනු කළාය. ඇය පැමිණිල්ල මගින් විවාහය විසුරුවා හැරීම සහ දරුවන්ගේ භාරකාරත්වය සම්බන්ධව තීන්දුවක් සහ තීන්දු ප්‍රකාශයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටියාය. සුමනා ඇයගේ පැමිණිල්ල තුළ සරත් වෙනත් කාන්තාවක් සමඟ අනියම් සබඳතාවක් පවත්වන බවත්, ඔහු අධික ලෙස මත්පැන් පානයට ඇබ්බැහි වී ඇති බවත් එම නිසා ඔහු දරුවන්ගේ භාරකාරත්වය සඳහා සුදුසු නොවන බවටත් කියා සිටියාය. අනෙක් අතට සරත්, සුමනාට දරුවන් බලා ගැනීමට සහ පෝෂණය කිරීමට ප්‍රමාණවත් ආදායමක් නොමැති බවත්, නමුත් තමන්ට එසේ කිරීමට ප්‍රමාණවත් ආදායමක් ඇති බවත් දක්වමින් දරුවන්ගේ භාරකාරත්වය තමාට ලබා දෙන ලෙස අයැද සිටියේ ය.

ඔබ මෙම නඩුවේ විනිශ්චයකාරවරයා ලෙස උපකල්පනය කරන්න. දරුවන්ගේ භාරකාරත්වය සම්බන්ධ නඩු තීන්දුවක් ලියන්න. ඔබගේ තීන්දුව තුළ දරුවන්ගේ භාරකාරත්වය සම්බන්ධයෙන් තීරණය කිරීම සඳහා ඔබ සළකා බලන අදාල නෛතික මූලධර්ම සහ අදාල අධිකරණමය තීන්දු අඩංගු විය යුතුය. (ලකුණු 20 )

හිමිකම් ඇවිරිණි.